**2017.03.13 වන දින හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයට පිළිතුරු වශයෙන් විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාගේ ප්‍රකාශය**

2017 මාර්තු 13 වන දින හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සහ නීතිමය ප්‍රතිසංස්කරණ මගින් ජාතිය විනාශ වීම යනුවෙන් මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදී.

එතුමාගේ ප්‍රකාශය අසත්‍ය, විකෘති කරන ලද හා සාවද්‍ය තොරතුරු වලින් ගහණයි. එම ප්‍රකාශය තුළ පරස්පරතා රාශියක් තියනවා.

හිටපු රාජ්‍ය නායකයෙකු වශයෙන් එතුමා සමාජය නොමඟ යැවීමට සිදු කරන ප්‍රකාශ නිසා වඩ වඩාත් සමාජ බෙදීම් වගේම දුරස්වීම් ඇති වෙන්න පුළුවන්. එතුමා අවධානයට ලක් කරන කරුණු වල තියන වැදගත්කම සළකලා ඒ ගැන සෘජු පිළිතුරක් ලබා දීමට මා බලාපොරොත්තු වෙනවා.

ලංකා ඉතිහාසයේ පළමු වතාවට රටේ ප්‍රධාන පක්ෂ දෙකේ එකතුවෙන් බිහි වූ සම්මුතිවාදී රජය මුළු රටේම ජනතාව එකට එකතු කිරීමට ගන්න පාරිශුද්ධ උත්සාහය ගැන කිසිසේත්ම අප සමාව ගත යුතු නෑ. අපි දේශපාලන පිළිමලුන්ට නිග්‍රහ පරිභව කර කර ඔවුන් හුදෙකලා කරලා ඔවුනට විරුද්ධව අවි අමෝරා ගෙන ම්ලේච්ඡ විදිහට හැසිරෙන්න කිසිම බලාපොරොත්තුවක් නැහැ.

අපේ රටේ හොඳ නම ජාත්‍යන්තර තලයේ ආයෙත් ස්ථාපනය කරලා නැවත පිරිසිදු කරලා රටේ ආයෝජන වගේම වාණිජ කටයුතු දියුණු කිරීමටත් සමෘද්ධිය ඇති කිරීමටත් ගන්න උත්සාහය ගැන අපි කිසිසේත් සමාව ගත යුතු නෑ. රාජපක්ෂ ජනාධිපතිතුමා කළා වගේ අපට දැනට ඉන්න ඒ වගේම දිනා ගත යුතු ජාත්‍යන්තර මිතුරන් පරම හතුරන් කර ගැනීමට වඩා අපේ වැඩපිළිවෙල යහපත් බව කිව යුතුයි. දූෂණය මුලිනුපුටා දලා ජාතියේ සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කරලා අවුරුදු ගානක් රාජපක්ෂ හා එතුමාගේ පවුලේ අය විනාශ කරමින් තිබුනු රටේ ධනය අරපරිස්සම් කර ගැනීම ගැන අප සමාව ගත යුතු නෑ.

එසේම දිගු කාලීන සාමය හා ස්ථාවරත්වය රටේ ඇති කර ගැනීමටත් හා දැඩි ප්‍රතිසංස්කරණවාදි වැඩපිළිවෙලක් ඉදිරියට ගෙන යාමත් වෙනුවෙන් අපි කිසිසේත් සමාව ගත යුතු නෑ. සියලුම ශ්‍රී ලාංකිකපුරවැසියෝ ප්‍රතිසංස්කරණ, කල් පවත්නා සාමය, සමෘද්ධිය හා ස්ථාවරත්වය මේ මොහොතේ තදින් අපේක්ෂා කරන බව අපි කවුරුත් දන්නවා.

හිටපු ජනාධිපති රාජපක්ෂ මහතාගේ සාවද්‍ය ප්‍රකාශ ගැන මා දැන් එකිනෙක කරුණු දැක්වීමට කැමතියි. එතුමා විසින් ප්‍රධාන වැදගත් ලියවිලි 05 ක් පිළිබඳව කරුණු දක්වලා තියනවා.

**1. 2015 ඔක්තෝබර් මාසයේදී ජිනීවා මානව හිමිකම් කොමිසම මගින් සම්මත කරන ලද යෝජනාව.**

ඉහත යෝජනාව අප වෙත සමඅනුග්‍රහය දක්වන්න කියලා බලෙන් පටවන එකක් නෙමෙයි. අප විසින් සහයෝගය දක්වලා 2015 දී සම්මත කරන ලද මානව හිමිකම් යෝජනාව ක්‍රියාත්මක කිරීමට මේ මාසය මුලදී මානව හිමිකම් කොමිසමේ 34 වන සැසියේදී තවත් අවුරුදු 02 අතිරේක කාලයක් ලබා දුන්නා. එම යෝජනාවට අපි අනුග්‍රහ දැක්වූයේ මේ රටේ ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරමින්, අයිතිවාසිකම් සීමා කරමින් ඔවුන්ට පීඩා කිරීම අත්හැර දාලා ඒ වෙනුවට ඔවුන්ට තව තවත් අයිතිවාසිකම් ලබා දීලා තමන්ගේ ජීවිතය උපරිම සතුටකින් ගත කිරීමටයි. අතීතයේදී විදපු දුක් වේදනා අමතක කරන්න හැකි වන්නේ ඒවා පිළිබඳ සොයා බලා විවෘතව කතා බහ කොට ඒවා පිළිබඳ සිතා බැලීමෙන් සහ යුක්තිය ඉටු කිරීමෙන් මිසක් ඒවා සඟවා සදාකාලයටම වළ දැමීමෙන් නෙමෙයි.

අපේ සමාජයේ දිගටම සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා ආයෙත් නොසිදුවීමට ක්‍රියා කිරීම තමයි අපේ පරම යුතුකම. එයින් අපිට ප්‍රෞඩ, එක්සත් දේශයක් ගොඩනගා ගන්න නියත වශයෙන්ම පුළුවන්. සත්‍ය සොයා බැලීම, අපරාධයන්ට ලක් වූවන්ට හානි පූර්ණය වගේම යුක්තිය පසිඳලීම අත්‍යාවශ්‍ය කාරණා. ඒ වගේම බරපතල අපරාධ ගැන රට අභ්‍යන්තරයේ අපිටම යුක්තිය පසිඳලීමට අසමත් නම් පමණයි ජාත්‍යන්තර නීතී රීතී අපට බලපාන්නේ.

ඒක නිසා මානව හිමිකම් කොමිසමේදී යෝජනාව සඳහා සම අනුග්‍රහය දැක්වීම මගින් වගවීම වෙනුවෙන් විශ්වාසනීය විදිහට ක්‍රියා කිරීමට අපට

හැකි බව අපි මුළු ලෝකයා ඉදිරියේම පෙන්වා සිටියා. ඒක වග කිව යුතු රටක් ලෙස අපේ ජාතික හැකියාව ජාත්‍යන්තරයේ සිටින අපගේ මිතුරන් හා පාර්ශවකරුවන් සමඟ එකට එකතුවී ක්‍රියා කළ හැකි බව පෙන්නුම් කර දීමක්. අප විසින් බලාපොරොත්තු වන සංක්‍රාන්තිය යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය එක කණ්ඩායමක්, එක ජන වර්ගයක් අනෙකාට වඩා ඉහළින් ඔසවලා තියන්න ගන්න උත්සාහයක් නොවෙයි. අපේ හමුදාව තනි කරලා කොටු කර ගන්න ඔවුන්ව තනි කරන්න මාන බලන උත්සාහයක්ද නෙමෙයි.

අප සියල්ලෝම ශ්‍රී ලාංකිකයන්. ප්‍රතිසන්ධානය සමගින් යහපත් ප්‍රතිඵල අත්වන්නේ අපි සියල්ලන්ටම. ඒක 5000 ට වැඩියෙන් අතුරුදහන් වෙලා ඉන්න හමුදා නිලධාරීන්ගේ පවුල් වලටත් අදාළයි. එසේම අතුරුදහන්වී සිටින සිය ගණනක් වූ පොලිස් නිලධාරීන්ගේ පවුල් වලටත් අදාලයි. එබැවින් ඒ සියල්ලන් වෙනුවෙන් අපි අතුරුදහන්වූවන් සෙවීමේ කාර්යාලය නිර්මාණය කළා.

විදේශ විනිසුරුවන් පිළිබඳ සංකල්පය හුදු අතිශෝක්තියට නැගූ කතාවක්. ඒමඟින් මහජනතාව බැරෑරුම් ලෙස නොමඟ යැවිය හැකි බව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා හොඳින් දන්නවා. එතුමාගේ කාලයේදී විවිධාකාර සංක්‍රාන්තීය යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයන් ක්‍රියාවට නඟන්න හැදුව බව අපට අමතක කරන්න බැහැ. ජාත්‍යන්තර නීතීඥ සහයද එතුමාගේ විවිධ කොමිෂන් සභා වලට නොඅඩුව ලබා ගත් බව සැවොම දන්නවා. ඒ අතරින් IIGE හෙවත් ස්වාධීන ප්‍රමුඛ පුද්ගලයින්ගේ ජාත්‍යන්තර කණ්ඩායම තුළ ඕස්ට්‍රේලියාව,කැනඩාව, යුරෝපා සංගමය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, ජපානය, නෙදර්ලන්තය සහ ජාත්‍යන්තර

පාර්ලිමේන්තු සංගමය වගේම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලයේද සාමාජිකයින් සිටියා. ඒ වගේම රාජපක්ෂ මහතා පත් කළ පරණගම කොමිසමේ ජාත්‍යන්තර නීතිඥ සාමාජිකයන් සිටි බව නොරහසක්.

2009 මැයි මාසයේ මානව හිමිකම් කොමිසම ජිනීවා හිදී සම්මත කළ යෝජනාවේ මෙසේ සඳහන් වෙනවා

> "ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් නැවත වතාවක් අවසන් විසඳුම වශයෙන් හමුදා විසඳුමක් පිළිනොගන්නා බවට ලබා දුන් ප්‍රතිඥාවද එසේම දේශපාලන විසඳුමක් ලබා දෙමින් 13 වෙනි ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කොට දිගු කාලීන සාමය හා සංහිඳියාව ශ්‍රී ලංකාව වෙත ලබා දීම පිළිගනිමු"

තම උද්ධච්චකම නිසා රටේ පුරවැසියන් වෙත තිබූ වගකීම පැහැර හරිමින් හිටපු ජනාධිපතිවරයා මුළු රටම ජාත්‍යන්තර පරීක්ෂණයක් වෙත තල්ලු කළා. එය ජිනීවා හිදී අන්තවාදී ලෙස ජාත්‍යන්තර මිතුරන් සමග ගැටුම් ඇති කර ගනිමින් මානව හිමිකම් කොමසාරිස්වරයාගේ කාර්යාලයට ලංකාවේ දොර හැර දුන්නා. රටේ වාසනාවකට මෙන් ජනාධිපති සිරිසේන මැතිතුමාගේ සහ අගමැති වික්‍රමසිංහ මැතිතුමාගේ දූරදර්ශී ක්‍රියා කලාපය නිසා අප රට වෙත ජාත්‍යන්තර විශ්වාසය නැවත දිනා ගනිමින් සංහිඳියාව සහ වගවීම අපේ ජාතික වගකීමක් බවට නැවත හරවා ගත්තා.

අතීතය හදිසියේම අමතක වෙලා වගේ හිටපු ජනාධිපති රාජපක්ෂ පිනීවා යෝජනාව ඉතා අතාර්කික අන්තගාමී විදිහට විග්‍රහ කරලා සමාජය බිය වද්දන, සමාජය බෙදා වෙන් කරන ප්‍රකාශ සිදු කරනවා. මේ ඔක්කොම ප්‍රෝඩාවල් ඔහු කරන්නේ 2016 දෙසැම්බර් මසදී විදේශ වාර්තාකරුවන්ගේ සංගමය ඉදිරියේ එතුමා කිව්වා වගේ නැවත හැකි ඉක්මනින් බලය ඩැහැ ගැනීමේ කෑදරකමින්.

**2. එතුමා අවධානය යොමු කරන දෙවන ලියවිල්ල නම් 2016 නොවැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ කමිටුවේ උප කමිටු 06 විසින් ඉදිරිපත් කළ වාර්තා.**

හිටපු ජනාධිපති රාජපක්ෂ මහතා සිතා මතා අමතක කරන කාරණේ වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වාර්තා, කමිටු වාර්තා සියල්ල සැකසුනේ සියලු දේශපාලන පක්ෂ වල සහභාගීත්වය ඇතුව කියලයි. එසේම රටේ පිළිගත් දේශපාලන පක්ෂ එකතු වෙලා හදපු වාර්තා මහජනයා වෙත විවෘතව එළි දැක්වීම සිදු කළේ අපේ රජයේ විනිවිදභාවය රැක ගැනීමේ වගේම හැම පාර්ශවයක් එක්කම සාකච්ඡා කිරීමේ විවෘත පදනම මත පිහිටා බව කියන්න කැමතියි. හිටපු ජනාධිපතිතුමා ඔක්කාටම හංගලා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට 18 වන සංශෝධනය ගෙනාපු විදිහ කාටවත් අමතක නැත. නිල කාල 02 ක් සේවය කරලා ඉවර වෙලා ජීවිත කාලයටම ජනාධිපති තනතුර රැක ගන්න තියන කෑදර කමට ගෙනාපු සංශෝධන වලට බලෙන් අනික් අයගේ අත් ඔසවා ගත් විදිහ හැමෝටම මතකයි.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කමිටු වාර්තා තවමත් සම්පූර්ණයෙන් එකඟතා ඇති කරගත් ඒවා නෙමෙයි. සමහර සංවේදී කරුණු හැමෝම එකඟවු  ඒවා

නොවෙයි. ඒවා  සාකච්ඡා සඳහා තාමත් විවෘතයි. ඒ සඳහා සියලුම පාර්ශව හා ජන වර්ග එක්ක විවෘතව කතා කරලා අපේ රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සකස් කර ගත යුතු බව ජනාධිපති සිරිසේන මැතිතුමා 2016 ජනවාරි 08 වන දා පාර්ලිමේන්තුවේදී කියා සිටියා.  රටේ ජනතාව අවසානයේදී ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා ඒවායේ ඇති වැදගත්කම බලලා භාර ගන්නවාද නොගන්නවාද කියලා තීරණය කරන්න ඕනේ. ඒ නියා ඉදිරිපත් වෙලා තියන සියලු යෝජනා පැහැදිලිව විග්‍රහ කරගෙන අවංකව මහජනතාව ඉදිරියට ගෙන යනවා මිසක් ඒවා පිළිබඳව විකෘති චිත්‍ර මවාපාමින් ජනතාව කොටවන - බෙදා වෙන් කරන ප්‍රකාශ කර කර නැවත වතාවක් රටත් ජනතාවත් මුලාවේ දාන්න අපි සූදානම් නෑ.

### 3. 2017 ජනවාරි මාසයේදී එළි දක්වපු සංහිඳියාව පිළිබඳ කාර්ය සාධක බලකායේ වාර්තාව පිළිබඳ රාජපක්ෂ ජනාධිපතිතුමා දක්වා ඇති අදහස් ගැන කිව යුතුයි.

සාමාජිකයින් 11 න් සමන්විත සංහිඳියා කාර්ය සාදක බලකාය 2016 ජනවාරි මාසයේදී පත් කරන ලද්දේ ගරු අග්‍රාමාත්‍යතුමායි.

එහිදී කාර්ය සාදක බලකායේ බලාපොරොත්තුව වූයේ සංහිඳියා ක්‍රියාදාමයක් සදහා අදාළ ආයතනික ව්‍යුහයක් එනම්, සත්‍ය ගවේෂණ ක්‍රමවේදයක්, අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයක් වගේම සත්‍ය කොමිසමක් සමඟ හානි පූර්ණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමයි. ඒ වගේම යම් විශේෂ නීතිඥ සහය ඇති අධිකරණ පද්ධතියක් ඇති කර ගැනීමත් ඇතුලත් වුනා.

සංහිඳියාව පිළිබඳ කාර්ය සාදක බලකාය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලාංකික ක්‍රියාදාමයක්. ඒකට රටේ සියලුම පලාත්වලින් මහජන පැමිණිලි 7306 ක් ලැබුණා. අතීතයේදී, විශේෂයෙන් රාජපක්ෂ ආණ්ඩුව කාලයේ විවෘතව අදහස් ප්‍රකාශ කරන්න බියවුනු ජනතාව කාර්ය සාධක බලකායට එළි පිට තම මත ඉදිරිපත් කළා. වැඩිපුරම අදහස් ලැබුනේ මඩකලපුව, අම්පාර හා දකුණු පළාත් වලින්. සංහිඳියා කාර්ය බලකාය ඉතා පුළුල් මහජන සහභාගීත්වයක් ඇතුව ලංකාව පුරා විසිරී සිටින සියලු ජනතාවගේ අදහස් එකතු කරලා එයාලගේ වාර්තාව සකස් කරලා තියනවා. රාජපක්ෂ මහතාගේ කාලේ වගේ මහජන සහභාගීත්වයක් නැති හොර රහස් වැඩ වගේ නැතුව වඩාත් ස්වාධීන මහජන සහභාගීත්වය ඇතුව කටයුතු කිරීමට සංහිඳියා කාර්ය සාධක බලකායට පුළුවන් වුනා.

එමගින් ඉදිරිපත් කළ සියලු යෝජනා පිළිගන්නා බව හෝ සියල්ල ක්‍රියාත්මක කරනවා කියලා එයින් අදහස් වෙන්නෙ නෑ. ඒත් ප්‍රාදේශීය භේදයක් නැතුව රට පුරා විහිදී සිටින ජනතා අදහස් නියෝජනයක් එම වාර්තාවේ ගැබ්වෙලා තියෙන බව පිළිගැනීමට පමණක් අපි කැමැතියි.

රටේ ජනතාවගේ අදහස්වලට ඇහුම්කන් දෙන්නත් ඒ ගැන විවෘතව බලන්නත්, හොද අදහස් පිළිගැනීමටත් අපි සූදානම්. හිටපු ජනාධිපතිතුමා එතුමාට උපදෙස් දෙන සමහරුන්ට දිරවා ගන්න බැරි අන්තවාදී කරුණු විතරක් උපුටගෙන සංහිඳියා කාර්ය සාදක බලකායේ යෝජනා ගැන මහජනතාව අතරේ බිය හා සැකය වපුරන්නට යොදා ගැනීම පිළිකුල් සහගත බව කිව යුතුයි.

**4. යුරෝපා සංගමය විසින් අප වෙත ලබා දීමට අපේක්ෂිත GSP සහනය පිළිබඳව එතුමා අදහස් දක්වලා තියනවා.**

ජනාධිපති සිරිසේන සහ අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ මැතිතුමන්ලා යටතේ වර්තමාන සම්මුතිවාදී ආණ්ඩුව අපේ රටටත් ජනතාවටත් හිමිවිය යුතු වාසි සහගත ජාත්‍යන්තර වෙළදාම් උපරිම ලෙස ලබාදීමට ක්‍රියා කරමින් ඉන්නවා. අපට කලින් හිමිවී තිබ්බ GSP සහනය නැති කොට අහිමි කොට දැම්මේ ජනාධිපති රාජපක්ෂගේ අත්තනෝමතික පාලන කාලයේදියි.

අනික් ඕනෑම ජාත්‍යන්තර සහයෝගිතා ක්‍රියාවලියක් වගේම යුරෝපා සංගමයෙන් ලංකාව වෙත වාණිජ හා දේශපාලන සහය ලැබෙන්නේ තමන්ගේ පුරවැසියන්ට ගෞරවනීය ලෙස සළකන යුක්තිගරුක නීති ගරුක ජාත්‍යන්තර ගිවිසුම් සුරකින රජයකට විතරයි. අන්තර්ජාතික නීති රීති විනාශ කරමින් පවුල් පාලන ගෙන යන  ජාත්‍යන්තරයෙන් කොන්වී හිටපු රාජපක්ෂ මහතාගේ පාලනය වගේ අත්තනෝමතික ආණ්ඩුවකට ඒ වගේ සහන ලැබෙන්නේ නෑ.

ඉහළ ආදායම් ඇති මිලියන 500 ක් විතර ජනගහනයක් ඉන්න යුරෝපා සංගමය ලංකාවට මූල්‍යමය වාසි සැපයෙන, ආයෝජන රට වෙත ගලා එන GSP වැනි පහසුකමක් පිරිනැමීමට ගොඩාක් උනන්දුයි. ජාත්‍යන්තර මානව හිමිකම් තත්වය, නීතියේ ආධිපත්‍ය, යහපාලනය වගේ ලංකාවේ බහුතර ජනතාව ඉල්ලා සිටින මානව හිතවාදී පාලන ක්‍රමයක් යුරෝපා සංගමයේ ප්‍රසාදයට ලක්වීම වළක්වන්න කාටවත් බෑ.

ලංකාවේ සියලු ජනතාව මානව හිමිකම් උපරිමයෙන් භුක්ති විඳින එක ගැන අප කවුරුත් සතුටු වෙන්න ඕන. ජනතාව ගැන සැළකිල්ලෙන් ක්‍රියා කරන වගකිව යුතු රජයක් විදිහට ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීමට වෙළඳ හා ආර්ථික ක්‍රියාකාරකම් වලට එළඹීම අපේ රජයේ වගකීමක්. අනාගත දැක්මක් සහිත ප්‍රයෝජනවත් සම්බන්ධතාවක් යුරෝපා සංගමය එක්ක ඇති කර ගැනීම දිගු කාලීනව රටේ යහපතට හේතු වෙන බව අපි කවුරුත් දන්නවා.

## 5. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අලුත් ත්‍රස්ත විරෝධී නීතියක් බවට පත්කිරීම හිටපු ජනපතිතුමාගේ චෝදනාවට ලක් වෙලා තියනවා.

පළමුවෙන්ම කියන්න ඕන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉතා ජුගුප්සාජනක විදිහට, ඒ වගේම සමහර අත්තනෝමතික කෲර අය වැරදියට අහිංසකයින් හිංසාවට පත් කරන්න අතීතයේ යොදාගත් නීතියක් බව. ඒක වැඩිය සමීප වෙන්නේ අරාජික පාලන ක්‍රමයක සංකේතයක් විදිහට ලෝකයට අපිව පෙන්වා දීමටයි. රාජපක්ෂ මහතාත් එතුමාගේ ගේ සහචරයනුත් එවැනි අතීතයක් තියන අනුන් පීඩාවට පත් කරන දරු දඬු නීතී රීති අනුකම්පා විරහිතව යොදා ගත්ත අය බව කවුරුත් දන්නවා.

ඒ වගේ ආදි කල්පිත දරුණු නීති රීති වෙනස් කරලා නූතන ලෝකය පිළිගත් ශීලාචාර නීති රීති රටට හඳුන්වා දීම දේශ ද්‍රෝහි ක්‍රියාවක් බව රාජපක්ෂ මහතා අර්ථ දැක්වීම හාස්‍යෝත්පාදකයි.

රජය විවේචනය කරන අය වගේම රටේ සියලුම පුරවැසියන්ද සුරකිමින් ඔවුන්ට ආරක්ෂාව සළසමින් රට පාලනය කිරීම අපේ රජයේ පදනම බව කිව යුතුයි. අප විසින් හදුන්වා දීමට යන ත්‍රස්ත විරෝධී නව පනත ආරක්ෂක හමුදා වල හා බුද්ධි අංශ වල නිලධාරීන්ට රාජ්‍ය ආරක්ෂා කරමින් මහජනතාවට ආරක්ෂාව සළසමින් සියලු පුරවැසියන්ගේ කායික හා මානසික අයිතිවාසිකම්වලට ගරු කරමින් ක්‍රියාත්මක කළ හැකි එකක් විදිහටයි හදලා තියෙන්නේ. අහිංසක මහජනතාව වධ බන්ධනයට ලක් කිරීමේ සම්ප්‍රදාය පිටු දැකීම වරදක් ලෙස හිටපු ජනාධිපතිතුමා කියනවා නම් එයින් පෙන්නුම් කරන්නේ අනුන් වධ බන්ධනයට ලක් කරන්න සමහර අය තියෙන නොනිම් ආශාවයි. ඔවුන් යා යුත්තේ මානසික වෛද්‍යවරුන් වෙතයි. නූතන ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාව තුළ වධ බන්ධන දීමට අහිංසකයින්ට පීඩා කරන්න කිසිදු ඉඩක් නැති බව එක හෙලා ප්‍රකාශ කරන්න මා කැමතියි.

අපගේ වර්තමාන සම්මුතිවාදී ආණ්ඩුව ක්‍රියාත්මක වෙන්නේ භීෂණය පතුරමින් බොරු කියමින් ජනතාවට පීඩා කරමින් නෙමෙයි. මේ ජනතාවාදී රජය විනිවිදභාවය, සත්‍ය, යුක්තිය හා සංහිඳියාව ඉහළට ඔසවා තබමින් පුරවැසියන්ගේ ආත්ම ගෞරවයට ගරු කරමින් ගෙන යන වැඩපිළිවෙල ගැන අපි කිසිදු ලෙසකින් සමාව ගැනීම හෝ ලැජ්ජා වීම කළයුතු නොවේ.

විවිධ ජනවර්ග අතර බිය සැක හා භීෂණය වපුරමින් ඔවුන් බෙදා වෙන් කොට සිදු කරන ආණ්ඩු පාලනය තවදුරටත් අපේ උත්තරීතර ජාතියට හිමිකර දිය යුතු නෑ. අපේ අනාගත මාර්ගය වැටී තියෙන්නේ විවෘත වගේම සියලු දෙනා ඇතුළත් ජාතියක් ලෙස සියලු පුරවැසියන් සමානයන් ලෙස සළකා සිදු කරන ගමනක් විදිහට බව කියන්න කැමතියි.

**අවසාන වශයෙන්, මාගේ මිත්‍රයකු වුද, මාගේ කැබිනට් සගයකු වුද, ටික කලකට මාගේ නායකයාද වූ මහින්ද රාජපක්ෂ මහතාට මට කියන්න ඇත්තේ, "ලැජ්ජයි මහින්ද ලැජ්ජයි".**